**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

# කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

# පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ (REIP) පවතින පහත සඳහන් පුරප්පාඩු වෙනුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 ප්‍රකාරව කොළඹ තදසන්න දුම්රිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව ඉහත ව්‍යාපෘතිය තුළ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය, රජයේ නීති රෙගුලාසි පිළිබඳ පරිචය සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති යටතේ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පළපුරුද්ද යන පූර්ව අවශ්‍යතා සපුරාලන සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංක | තනතුර | වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ(ඉඩම්) | C | 01 |
| 02 | ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිලධාරි | E | 02 |
| 03 | සමාජ ආරක්ෂණ නිලධාරි | F | 03 |
| 04 | ඉඩම් නිලධාරි | F | 02 |
| 05 | සමාජ ආරක්ෂණ සහකාර | MN-1 | 02 |

ඉහත සඳහන් තනතුරුවලට අදාළ සුදුසුකම් / පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා පහත පරිදි වේ.

## 01. සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ ( ඉඩම් ) - තනතුරු සංඛ්‍යාව 01

ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ අනුව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ හා පරිසර) යටතේ කාර්යය / කර්තව්‍ය ඉටුකරමින් ව්‍යාපෘති අධ්‍යක්ෂකට පූර්ණ සහය දැක්විය යුතු අතර, ව්‍යාපෘතියට අදාළ ඉඩම් අත්කරගැනීමේ ප්‍රගති වාර්තා සැකසීම, ඇස්තමේන්තු හා කාර්තුමය වාර්තා සකස් කිරීම, වන්දි මුදල් ගෙවීම, පාර්ශවකාර ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම, අත්කරගනු ලබන ඉඩම් සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් ඉටුකිරීම හා වගකීම් දැරීම කළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01,02 හෝ 03 අතරින් එක් සුදුසුකමක් )

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාළව උපාධියක් ලබා තිබීම.

**සහ**

ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති) සුදුසුකම් ලබා තිබීම සහ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

**සමග**

අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කළමණාකරන මට්ටමේ අවම වශයෙන් වසර 13 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

02. ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ආශ්‍රිත /අධි සාමාජිකත්වය ලබා තිබීම.

**සමග**

ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

03. ක්ෂේත්‍රයට අදාළව රජයේ දීප ව්‍යාප්ත සේවාවක I පන්තියේ හෝ සමාන මට්ටමේ නිලධාරියෙක් වීම.

**සහ**

ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීයවේදී ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සමග**

රජයේ දීප ව්‍යාප්ත සේවාවක I පන්තියේ වසර 05 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 02. ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිලධාරි - තනතුරු සංඛ්‍යාව 02

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (පරිසර හා සමාජ ආරක්ෂණ) යටතේ කාර්ය/ කර්තව්‍යයන් ඉටුකරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව සමාජ ආරක්ෂණ සැලසුම් සකස් කිරීම,ප්‍රගති වාර්තා සකස් කිරීම,ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ අනුව කාර්තුමය වාර්තා සකස් කිරීම හා සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ) විසින් පවරනු ලබන රාජකාරි ඉටු කිරීම

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01, 02,03 හෝ 04 අතරින් එක් සුදුසුකමක් )

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**සමග**

සමාජ ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 06ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

02. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනුලබන තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 07 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම

**සමග**

සමාජ ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 06ක සේවා පළපුරුද්දක් ලබා තිබීම

**සමග**

03. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම

**සමග**

සමාජ ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 11ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

04. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම

**සමග**

සමාජ ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 16ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 03. සමාජ ආරක්ෂණ නිලධාරී - තනතුරු සංඛ්‍යාව 03

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (පරිසර හා සමාජ ආරක්ෂණ) යටතේ සමාජ ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පවරනු ලබන රාජකාරි ඉටු කිරීම, සමාජ ආරක්ෂණ ප්‍රගති වාර්තා සැකසීම, නැවත පදිංචි කිරීමේ කටයුතු සමීක්ෂණ වාර්තා සැකසීම, සමාජ ආරක්ෂණ ගැටලු විසඳීම.

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01, 02 ,03 හෝ 04 අතරින් එක් සුදුසුකමක් )

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**සමග**

සමාජ ආරක්ෂණ ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

02. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සමග**

සමාජ ආරක්ෂණ ක්ෂෙත්‍රයට අදාළව අවම වශයෙන් වසර 04 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

03. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සමග**

සමාජ ආරක්ෂණ ක්ෂෙත්‍රයට අදාළව අවම වශයෙන් වසර 09 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සමග**

සමාජ ආරක්ෂණ ක්ෂෙත්‍රයට අදාළව අවම වශයෙන් වසර 14 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 04. ඉඩම් නිලධාරී - තනතුරු සංඛ්‍යාව 02

සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ(ඉඩම්) යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් පවරනු ලබන රාජකාරි ඉටුකිරීම, ඉඩම් අත්කරගැනීමේ ප්‍රගති වාර්තා සැකසීම, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය කරමින් අත්කර ගනු ලබන ඉඩම් සඳහා රජයේ ඉඩම් අත්පත් කරගැනීමේ පනත ප්‍රකාරව රාජකාරි හා වගකීම් ඉටුකිරීම.

**අවශ්‍ය සුදුසුකම් :**

(පහත අනු අංක 01,02, 03 හෝ 04 අතරින් එක් සුදුසුකමක් )

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**සමග**

ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

02. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සමග**

ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව අවම වශයෙන් වසර 04 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

03. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සමග**

ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව අවම වශයෙන් වසර 09 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

**සමග**

ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියට අදාළව අවම වශයෙන් වසර 14 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 05. සමාජ ආරක්ෂණ සහකාර - තනතුරු සංඛ්‍යාව 02

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (පරිසර හා සමාජ ආරක්ෂණ) යටතේ කාර්ය/ කර්තව්‍ය ඉටුකරමින් සමාජ ආරක්ෂණයට අදාළව පවරනු ලබන රාජකාරී හා වගකීම් ඉටු කිරීම.

**අවශ්‍ය සුදුසුකම් :**

විෂයන් 01කට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් 03ක් අ.පො.ස. (උසස් පෙළ) සමත්ව තිබීම.

මෙම තනතුර සඳහා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ මූලික වැටුපට 50%ක දීමනාවක් හිමිවේ.

**වැටුප් පරාසය :**

C කාණ්ඩය රු.285,000 - 305,000

E කාණ්ඩය රු.170,000 - 185,000

F කාණ්ඩය රු.120,000 - 135,000

MN-1 රු.27140 – 10 x 300 – 11 x 350 – 10 x 495 – 10 x 660 - 45,540

**පොදු කොන්දේසි :**

01. **වයස් සීමාව :** සෑම අයදුම්කරුවෙකුම වයස අවුරුදු 64ට අඩු අයවලුන් විය යුතුය. (වයස අවුරුදු 64ට වැඩි අයවලුන් සලකා නොබැලේ).

02. සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායකත්වය (සේවකයාගෙන් 8%ක් සහ සේවා යෝජකයාගෙන් 12%).

03. **සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි :** ආරම්භයේ දී මෙම පත්කිරීම කොන්ත්‍රාත් පදනමින් වසරක් (01) සඳහා වන අතර, සතුටුදායක කාර්ය සාධනය හා ව්‍යාපෘති කාල සීමාව මත පදනම්ව සේවා කාලය දීර්ඝ කර ගැනීමේ හැකියාව පවතී.

**අයදුම්පත් :**

ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් ස්වකීය අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ අදාළ කේෂ්ත්‍රයන්ගේ පළපුරුද්ද පිළිබඳ විස්තර සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ද විස්තර දැක්වෙන අයදුම්පත් 16.03.2026 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය, නො. 217, කොටා පාර, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර එවිය යුතුය.

රාජ්‍ය සේවයේ/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය**
**නො. 217, කොටා පාර, කොළඹ 08.**
**2026.03.02**